කොළඹ විශ්වවිද්‍යාලය , ශ්‍රී ලංකාව

**නීති පීඨය**

**නීතිවේදී උපාධි පරීක්ෂණය, සිව්වන වසර - 2020**

**බදු නීතිය**

**(පැ තුනයි)**

**මුළු ප්‍රශ්න සංඛ්‍යාව: 07**

ඕනෑම ප්‍රශ්න හතරකට **පමණක්** පිළිතුරු සපයන්න.

(අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.)

---

1. ‘සරල බදු ක්‍රමයක්, බදු ගෙවන්නන්ට තම සත්‍ය හා සැලසුම් කළ ගනුදෙනු වල බදු ප්‍රතිපල අවබෝධ කර ගැනීමට වඩාත් හැකියාව ලබා දෙමින්, දෝෂ අවම කොට, එම ක්‍රමය කෙරෙහි තිබෙන ගෞරවය වැඩි කරවයි. බදු ගෙවන්නන්ට එම රීති අවබෝධ කර ගැනීමට සහ ඒවා මත නිවැරදිව හා වියදම් කාර්යක්ෂම වන පරිදි අනුගත වීමට හැකි විය යුතුය.’

   ශ්‍රී ලංකාවේ වර්තමාන බදු ක්ෂේත්‍රය තුළ සරල බව (Simplicity), පහසු බව (Convenience) සහ ස්ථායි බව (Stability) යන බදු මූලධර්ම කෙතරම් ප්‍රමාණයකට අනුගමනය කර ඇත්දැයි යන්න විවේචනාත්මකව තක්සේරු කරන්න.

   (ලකුණු 25)

2. සුමිත් ප්‍රනාන්දු පරිඝණක මෘදුකාංග පිළිබඳ සමාගමක හිමිකරු වෙයි. ඔහු 2019/2020 තක්සේරු වර්ෂය තුළ පහත සඳහන් වියදම් සිදුකළ අතර ඔහුගේ ආදායම ගණනය කිරීමේදී එකී වියදම් අඩුකිරීමට අපේක්ෂා කරයි. ඔබ ඔහුට උපදෙස් දෙන්නේ කෙසේද?

(අ) සමාගමේ සියලු කාර්යයන් කේන්ද්‍රගත කිරීම උදෙසා ප්‍රධාන පරිසණක සැකසුම් ඒකකය සවිකිරීමේ වටිනාකම රු. 1,000,000/- කි. මෙය වසර දහයක් පවත්වා ගැනීමට අපේක්ෂා කරයි.

(ආ) පුද්ගලික තොරතුරු ආරක්ෂා කිරීම සඳහා වන නව මෘදුකාංගයක් පිළිබඳ පර්යේෂණ සිදු කිරීම සහ වැඩිදියුණු කිරීම වෙනුවෙන් රු. 250,000/- මුදලක් වැය කළේය.

(ඇ) බදු වර්තා ගොනු කිරීම පැහැරහැරීමෙන් පසු සකස් කළ බදු තක්සේරුව අභියෝගයට ලක් කිරීම වෙනුවෙන් දරන්නට වූ නඩු ගාස්තු සඳහා රු. 500,000/- ක මුදලක්.

(ඈ) කාර්යාලය අලුත්වැඩියා කිරීම සහ පරිසණකවල තත්ත්වය ඉහල නැංවීම වෙනුවෙන් දරූ රු. 75,000/- ක මුදලක්.

(ඉ) කාර්යමණ්ඩලයේ වාර්ෂික විනෝද ගමන වෙනුවෙන් දරූ රු. 100,000/- ක මුදලක්.

(ලකුණු 25)

3. (අ) සහ (ආ) කොටස් දෙකෙහි, 2019/2020 තක්සේරු වර්ෂයට අදාළව පහත සඳහන් සිද්ධි දාමයන්හි පැන නැගෙන ආදායම් බදු වගකීම, අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ විනිශ්චිත තීන්දු ඇසුරින් සාකච්ඡා කරන්න.

(අ) සජිත් පෙරේරා මහතා කොටුව පිහිටි සන්ටෙල් ටෙලිකොම් මූලස්ථාන කාර්යාලයේ සේවය කරයි. ඔහු අන්තර්ජාතික ඇමතුම් අංශයේ ශාඛා කළමනාකරු වේ. ඔහු යටතේ විසිපස් දෙනෙකුගෙන් සමන්විත කාර්යය මණ්ඩලයක් සේවය කරයි. රු. 300,000/- වන වැටුපට අමතරව සන්ටෙල් ආයතනය ඔහු වෙත කාර් රථයක් හා එයට රු. 100,000/-ක පෙට්‍රල් දීමනාවක්ද සපයා දී තිබෙන අතර රු. 75,000/- ක මුදලක්ද ඔහුගේ නිවසේ මාසික කුළිය ලෙස ගෙවයි. ඔහුගේ සේවය අත්‍යවශ්‍ය ගණයේ සේවයක් වීම හේතුවෙන් ඔහුට දවසේ පැය 24 පුරාම සේවයේ

නිරතව සිටීම අවශ්‍ය වන බැවින්, ඔහුගේ පවුලේ සාමාජිකයන්ගේ පරිහරණය වෙනුවෙන් වෙනත් කාර් රථයක් සමාගම විසින් සපයා දී තිබේ. මෑතකදී, සජිත් මහතා හදිසි රෝගී තත්වයක් හේතුවෙන් රෝහල් ගත කල අතර සමාගමේ සුබසාධන අරමුදල රු. 150,000/- ක් වූ එම බිල ගෙවීය. තවද, 2019 වර්ෂ අවසාන තක්සේරු වලට අනුව, සජිත් මහතාගේ අංශය අනිකුත් සියලුම අංශ අතරින් වැඩිම ලාභ ඉපයූ අංශය ලෙස සඳහන් විය. සන්වෙල් ආයතනය, සජිත් මහතා වෙත ඔහු සිදු කළ කාර්යය භාරය වෙනුවෙන් රු. 500.000/- ක ප්‍රදානයක් ලබා දුන්නේය.

(ලකුණු 12.5)

(ආ) ජංගම දුරකථන බෙදාහරින්නකු වන රාජා හට හෝමාගම පොදු වෙළඳ සංකීර්ණයේ වෙළඳසැලක් හිමිව තිබිණි. ව්‍යාපාරයෙන්, ඔහුගේ මාසික ආදායම රු. 75000/- ක් වේ. ඔහු ඔහුගේ ව්‍යාපාරය තව දුරටත් ව්‍යාප්ත කිරීමේ චේතනාව සහිතව ඔහු, හෝමාගම නගරයේ නියෝජිත තැපැල් කාර්යාලයක් විවෘත කළේය. දුරකථන ඇමතුම් ලබාගැනීමේ පහසුකම්, ඊමේල් පහසුකම්, ෆැක්ස් පහසුකම් සහ අන්තර්ජාල පහසුකම් ඇතුළු නොයෙක් ආකාරයේ පහසුකම් රැසක් ඔහු ඔහුගේ නව වෙළඳසැලෙන් සැපයීය. ඔහු සැපයූ සේවා වලින් ලද ගාස්තුව නිසා ඔහුගේ මාසික ආදායම තුන් ගුණයකින් ඉහළ ගියේය. හෝමාගම වෙළඳ සංගමයේ සාමාජිකයන් අතරින්, නැගී එන හොඳම සේවයෝජකයාට හිමි රු. 250,000/- ක ප්‍රදානයක් ඔහුට ලැබිණි. මාස කිහිපයකට පසුව, ඔහු නවීන ඡායා පිටපත් යන්ත්‍ර දෙකක් සහ පාවිච්චි කළ කාර්යාල ලී බඩු තොගයක් පිළිවෙලින් රු. 150,000/- හා රු. 50,000/- බැගින් වූ මුදලකට විකුණුවේය.

(ලකුණු 12.5)

4. (අ) සහ (ආ) කොටස් දෙකටම පිළිතුරු සපයන්න.

(අ) එක් එක් ප්‍රභේදයන්ටආවේනික වෙනස් වූ ලක්ෂණ සසඳමින් හා වෙනස්කොට දක්වමින්, "ආයෝජන ආදායම" හා "ප්‍රාග්ධන ලාභ", අතර වෙනස සුදුසු උදාහරණ සහිතව ගෙනහැර දක්වන්න.

(ලකුණු 10)

(ආ) "අන්ලෙසකින්, ධනවත් පුද්ගලයන්ට වඩා දිළිඳු පුද්ගලයන්ට බලපානු ලබන අනේක විධ වක්‍ර බදු සඳහා ඉහළ බදු මුදල් ගෙවීමට සිදුවිය හැකි පාරිභෝගිකයන් මත පැනවෙන අනවශ්‍ය බදු බර අඩු කිරීම උදෙසා, ප්‍රාග්ධන ලාභ මත බදු උපකාරී වේ".

ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නෙහිද? ප්‍රාග්ධන ලාභ මත බදු වගකීම පැවරීමට අදාළව 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ ඇතුළත් ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ "ආයෝජන වත්කම්" (investment asset), "ප්‍රතිෂ්ඨාව" (consideration), "මිල" (cost) හා "උපලබ්ධි කිරීම" (realization) යන යෙදුම්හි අර්ථ නිරූපණයන් පිළිබඳ විශේෂ අවධානය යොමු කරමින් ඔබේ පිළිතුර සනාථ කරන්න.

(ලකුණු 15)

5. සංකර් මහතා සහ Giant (Pvt) Ltd, S & G නමින් හඳුන්වන හවුල් ව්‍යාපාරයේ සමාන හවුල්කරුවන් වේ. 2019/20 තක්සේරු වර්ෂය සඳහා එම පාර්ශ්වයන් දෙක පහත සඳහන් ආදායම් ලැබීය.

(අ) S & G ව්‍යාපාරය සතුව සම්පූර්ණ ව්‍යාපාර ආදායම රු. 1,000,000/- සහ කුලී ආදායම රු. 500,000/- වේ. 2020 මාර්තු මාසයේදී, සංකර් මහතා සහ Giant (Pvt) Ltd, ඉහත ආදායම් වලින් සමාන කොටස් ලැබීය. කෙසේ නමුත්, S & G ව්‍යාපාරය හවුල්කරුවන්ගේ සම්පූර්ණ ආදායමින් 8% ක් රඳවා ගැනීමේ බදු (withholding tax) ලෙස අඩු කළ අතර එය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ගෙවීය.

(ආ) ඉහත දැක්වූ කරුණුවලට අමතරව, සංකර් මහතා වෙත සේවානියුක්තියෙන් ලැබෙන ආදායම ලෙස රු. 800,000/- ක මුදලක් සහ ආයෝජන වත්කම් උපලබ්ධි වීමෙන් ලද ලැබීම් ලෙස රු. 150,000/- ද, ලාභාංශ ලෙස රු. 50,000/- ද ඇතුළත් ආයෝජන ආදායම් ලෙස රු. 200,000/- ද ලැබිණි. සංකර් මහතා අනුමත පුණ්‍ය ආයතනයක් වෙත රු. 200,000 ක් වටිනා මුල්‍ය ප්‍රදානයක් කළේය.

(ඇ) Giant (Pvt) Ltd වෙත, මෙම තක්සේරු වර්ෂය සඳහා S & G ව්‍යාපාරයෙන් ලබු රු. 750,000/-ක්ද ඇතුළත්ව සම්පූර්ණ ආදායම ලෙස රු. 2,500,000/- ලැබිණි.

2020 මාර්තු මාසයේදී, Giant (Pvt) Ltd, තම වර්තමාන කොටස් හිමියන් වෙත තම ලාභ වලින් රු. 1,000,000/- වටිනා ප්‍රසාද කොටස් නිකුත් කළේය.

අදාළ ව්‍යවස්ථාපිත විධිවිධාන ඇසුරින්, ගෙවිය යුතු බදු ගණනය කරන විට, පවතින සහන උපරිම වශයෙන් ලබාදිය හැක්කේ කෙසේදැයි උපදෙස් දෙමින් එක් එක් පාර්ශ්වයන් වෙත පවතින ආදායම් බදු වගකීම පිළිබඳව සාකච්ඡා කරන්න.

(ලකුණු 25)

6. (අ) හෝ (ආ) යන කොටස් දෙකෙන් **එක් කොටසකට පමණක්** පිළිතුරු සපයන්න.

(අ) "බදු වාර්තා ගොනු කිරීමට නියමිත විටක යම් බදු ගෙවන්නකු එය සිදු කිරීම පැහැර හැර ඇත්නම්, පනතින් දැඩි දඩුවම් පමුණුවන අතර, පරිපාලන ක්‍රියාවලිය තුළින් පිරිනමන පොදු ආරක්ෂණයද ඉවත හෙලයි".

2017 අංක 24 දරන දේශීය ආදායම් පනතෙහි ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ අදාළ අධිකරණ මතය මත පිහිටමින් මෙම ප්‍රකාශය ඇගයීමට ලක් කරන්න.

(ආ) යමෙකුගේ බදු ගෙවීමේ වගකීම උද්ගත වීමට පෙර, එය මග හැරීම, සම්පූර්ණයෙන්ම නීත්‍යානුකූල ක්‍රියාවක් වුවද දේශීය ආදායම් දෙපාර්තමේන්තුව නිරතුරුවම, ඒවාට මුහුණ පාන ආකාරය අනුව එකී දුර්වලතා වළකාමින් මෙම ක්ෂේත්‍රයට සීමා සකසයි.

මෙය සිදු කරනු ලබන මූලික ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ ක්‍රමෝපායයන් ඇසුරෙන් බදු මග හැරීමේ යෝජනාක්‍රම (tax avoidance schemes), දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දෘෂ්ටිකෝණයෙන් විමසන්න.

(ලකුණු 25)

7. (අ) සහ (ආ) **කොටස් දෙකටම** පිළිතුරු සපයන්න.

(අ) "යම් බදු කාලසීමාවක් සඳහා අනුමත ආකෘතියෙන් බදු වාර්තාවක් ගොනු කර ඇති ස්වයං තක්සේරු බදු ගෙවන්නකු, මේ පනතේ සියළු කාර්යය සඳහා බදු වාර්තාව අදාළ වන කාලසීමාව වෙනුවෙන් (ශුන්‍ය ප්‍රමාණයක්ද ඇතුළුව) වාර්තාවේ සඳහන් පරිදි

ගෙවිය යුතු බදු ප්‍රමාණය සම්බන්ධයෙන් තක්සේරුවක් සිදු කර ඇති බවට සැලකිය යුතුය." (132 වගන්තිය, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත)

අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ නඩු තීන්දු නීතිය ඇසුරින් බදු වාර්තා හා බදු තක්සේරු සකස් කිරීමේ ක්‍රියාවලිය සාකච්ඡා කරන්න.

(ලකුණු 12.5)

(ආ) "පරිපාලන සමාලෝචන තීරණයකින් අතෘප්තියට පත් තැනැත්තෙකුට එම තීරණයට විරුද්ධව බදු අභියාචනා කොමිෂන් සභාවට අභියාචනා කළ හැකිය." (140 වගන්තිය, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත)

2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන ඇසුරින් අභියාචනා ක්‍රියාවලිය විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

(ලකුණු 12.5)

*********************************************